# නිවේදනය යි!

**පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වෙත.**

<u>1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත උල්ලංඝනය කරමින් ග්ලයිෆොසේට් නිෂ්පාදන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම.</u>

තේ සහ රබර් වගාව සඳහා සීමිත තත්ත්ව යටතේ ග්ලයිෆොසේට් ආනයනය කර නිකුත් කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක PS/CP/20/2018 හා 2018.05.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක 18/0925/801/004 හා 2018.05.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලැබ 2018 සැප්තැම්බර් මස සිට ආරම්භ වන මාස 36 ක කාලයක් සඳහා නීත්‍යානුකූලව ග්ලයිෆොසේට් ආනයනය කිරීම, බෙදා හැරීම හා භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරීමේ වගකීම පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත.

මේ අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ඇතිකර ගෙන ඇති එකඟතාවයන් පරිදි තේ සහ රබර් වගාකරුවන් සඳහා වාර්ෂිකව අවශ්‍ය ග්ලයිෆොසේට් සංයෝජන ආනයනය සිදුකර ඇසිරීම සහ බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ කෘෂි යෙදවුම් සැපයීමේ ආයතනයක් වන "සිපෙට්කෝ" සමාගම විසින් පමණක් සිදුකර ඇසිරීම සහ බෙදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කර, ඒ සඳහා කාර්‍යක්ෂම බෙදාහැරීමේ යාන්ත්‍රණයක් සැළසුම් කර ක්‍රියාත්මක කරමින් ඇත. මේ අනුව, දිවයින තුළ අලෙවි කිරීම හෝ බෙදාහැරීම හෝ භාවිතය සඳහා අවසර ඇති නීත්‍යානුකූල ග්ලයිෆොසේට් "සිපෙට්කෝ ග්ලයිෆොසේට්" වෙළෙඳනාමය යටතේ පමණක් නිකුත් වන අතර, එම නිෂ්පාදන "සිපෙට්කෝ" සමාගම සතු තොග හා ප්‍රාදේශීය ගබඩා හැර වෙනත් තොග හෝ සිල්ලර අලෙවිසැල්වල අලෙවි කිරීමට අවස්ථාවක් නොමැත. නීත්‍යානුකූලව ග්ලයිෆොසේට් භාවිතය සඳහා අවසර ඇති තේ සහ රබර් වැවිලිකරුවන් හඳුනා ගැනීම සඳහා කාර්‍යක්ෂම හා ප්‍රායෝගික ක්‍රමවේදයක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සැළසුම් කර ක්‍රියාත්මක කරමින් ඇත. මේ වන විට ආනයනික ග්ලයිෆොසේට් 36% ක් අඩංගු (සංස්ථානික ක්‍රියාකාරී) සංයෝජනයක් "සිපෙට්කෝ" සමාගම විසින් "සිපෙට්කෝ ග්ලයිෆොසේට්" (ලියාපදිංචි අංකය N540100) යන වෙළෙඳනාමය යටතේ පමණක් බෙදාහැරෙමින් ඇත.

එනම්, "සිපෙට්කෝ ග්ලයිෆොසේට්" පූර්ණ වල්නාශකය බෙදාහැරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා ඇතුළු වගකීම්ලත් පාර්ශවකරුවන්ගේ එකඟතාවය සහිතව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2018.10.22 දිනැති 2018/01 චක්‍රලේඛය නිකුත් කර ඇත.

තවද, 2019.01.01 දාතමින් චක්‍රලේඛ අංක RP/AUO/2019-1 මඟින් 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතට අනුව නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද ග්ලයිෆොසේට් සංයෝජනවලට පරිබාහිර නිෂ්පාදන සහ භාවිතාවන්

සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් තොරතුරු නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සහ සුපරීක්ෂාකාරීව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

මේ අතර, 71% ක් ග්ලයිෆොසේට් අඩංගු ANU 71 හා D-Era යන වෙළෙඳනම් වලින් සමන්විත කුඩා ඇසුරුම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ කිසිදු නීත්‍යානුකූල වලංගු භාවයක් නොමැති බව මෙයින් අවධාරණය කරමි (ඇමුණුම 1). පළිබෝධනාශක අලෙවි ක්ෂේත්‍රයේ සමහර පුද්ගල කණ්ඩායම් විසින් නීති විරෝධී ග්ලයිෆොසේට් සංයෝජන ඇසිරීම, බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සිදුකරමින් පවතින බව මූලික පරීක්ෂණවල දී අනාවරණය කර ගෙන ඇත.

දිවයිනේ සමහර පළිබෝධනාශක අලෙවිසැල් සම්බන්ධ කර ගනිමින් සිදු කරන මෙම නීති විරෝධී අලෙවි ක්‍රියාකාරකම් පිළිබඳව උක්ත පනත යටතේ දිවයින පුරා සිටින නම් කරන ලද බලයලත් නිලධාරීන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වශයෙන් එක් එක් නිලධාරීන් සතු පරිපාලන බල ප්‍රදේශ ආවරණය වන පරිදි දිවයින පුරා අවශ්‍ය විමර්ෂණ සිදුකර සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

අනුමත කරන ලද ග්ලයිෆොසේට් සංයෝජන පිළිබඳ තොරතුරු අඩංගු ලැයිස්තුව www.doa.gov.lk දරන වෙබ් අඩවියට ප්‍රවේශවීමෙන් හෝ 2018.09.13 දින අංක 2088/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය, www.documents.gov.lk මගින් හෝ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කර ඇති වලංගු බලපත්‍ර පරීක්ෂා කිරීම මගින් හෝ දැනගත හැකි ය.

මෙම නිවේදනය අදාල පාර්ශවකරුවන්ට හෝ සියළුම පළිබෝධනාශක අලෙවිකරුවන් හා වැවිළි ක්ෂේත්‍රයේ සියළුම කළමණාකරුවන් හා මේ පිළිබඳව උනන්දුවක් දක්වන පුද්ගලයන්ගේ දැන ගැනීම පිණිස බෙදා හරින ලෙස මම ඔබගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. මේ පිළිබඳ අවශ්‍ය ඕනෑම තොරතුරක් සඳහා සහ ඉහත සඳහන් අවශ්‍යතා උල්ලංඝනය වන අවස්ථා වෙතොත්, ඒ පිළිබඳ තොරතුරු දැන්වීම සඳහා සහ අවශ්‍ය නීති සම්බන්ධීකරණ සේවා සඳහා පහත දැක්වෙන දුරකථන හා ෆැක්ස් අංක ඔස්සේ මෙම කාර්යාලය අමතන මෙන් ඉල්ලා සිටිමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2019 සැප්තැම්බර් මස 23 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 (Mobile) 0772363824


Ammonium Salt of
Glyphosate 71% SG
Anu® 71
Systemic Herbicide


D-Era
Manufactured by:
Dhanuka Agritech Limited